# කාර්ය පත්‍රිකාව - 19 වන සතිය

- **නිපුණතාව 0.1 - නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි**
- **නිපුණතා මට්ටම 1.3 - සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) මුසලඬි වන්නමේ අඩව්ව නර්තනය කිරීමේදී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි

(i) අවග්‍රහ ලක්ෂණයෙන් යුක්ත වීම
(ii) අවග්‍රහ ලක්ෂණ අඩව්වේ මැද අවස්ථා හතරකදී දක්නට ලැබීම
(iii) අවග්‍රහ ලක්ෂණ අවස්ථා තුනක දී දක්නට ලැබීම
(iv) අවග්‍රහ ලක්ෂණ දක්නට නොලැබීම
(v) අවග්‍රහ ලක්ෂණ අවස්ථා දෙකකදී පමණක් දක්නට ලැබීම

(02) උඩරට වන්නමක් නර්තනය කිරීමේදී අන්තර්ගත විය යුතු කොටස් ගණන

(i) 5 කි
(ii) 6 කි
(iii) 4 කි
(iv) 3 කි
(v) 7 කි

(03) ''කුඳගත කුඳ ගත කුකුතක ජිං තට කුංදත්'' යන අලංකාර බෙර පදයට අනුව නර්තනය කළ හැකි වන්නම වන්නේ

(i) මයුරා වන්නම
(ii) සැවුලා වන්නම
(iii) මුසලඬි වන්නම
(iv) ගණපති වන්නම
(v) සිංහරාජ වන්නම

(04) මයුරා වන්නමේ සීරුමාරුව හා අඩව්ව නර්තනය කිරීමේ නිවැරදි ක්‍රමවේදය වන්නේ

(i) පළමු ආඝාතය තැබීමත් සමඟ ආරම්භ කිරීම
(ii) පළමු ආඝාතය තැබීමෙන් පසුව ආරම්භ කිරීම
(iii) දෙවන ආඝාතය තැබීමත් සමඟ ආරම්භ කිරීම
(iv) තුන්වන ආඝාතය තැබීමත් සමඟ ආරම්භ කිරීම
(v) තුන්වන ආඝාතය තැබීමෙන් පසුව ආරම්භ කිරීම

(05) උඩරට වන්නමක් නර්තනය කිරීමේ දී අලංකාර පද නටනු ලබන්නේ

(i) කවියටයි
(ii) තානමටයි
(iii) බෙර පද වාදනයටයි
(iv) තානම, කවිය යන දෙකටයි
(v) බෙර පද සමග කවියටයි

**හිස්තැන් පුරවන්න**

(01) වන්නමක ........................................................................ එහි නාද මාලාව කියාපායි.

(02) වන්නම් නර්තනයේදී කවි ගායනයට අනුව හස්ත චලන ඉදිරිපත් කිරීම ................................................................. මණ්ඩිය නමින් හැඳින්වේ.

(03) ''තාත් තකට තරිකිට දොද් දොං'' යන අඩව්ව ................................................. වන්නමට නර්තනය කරනු ලබයි.

(04) මුසලඩි වන්නමේ කස්තිරම මාත්‍රා 3 + 4 තාලයට හා මාත්‍රා ................................................................ තාලයට නර්තනය කිරීම සුවිශේෂී ලක්ෂණයකි.

(05) බෙර පදය, .................................................................. හා .................................................. යන මේවා සම්ප්‍රදායන් ත්‍රිත්වයේ වන්නම් ව්‍යුහය තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයන්ය.

## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

(01) පහත බෙර පද අදාල තිත් රූප වලට අනුව ප්‍රස්තාර කරන්න

(i) ජිං ගත ගොගො
(ii) දොං ජිං ජිං තකට දොංතක
(iii) තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට

(02) උඩරට වන්නමක් නර්තනය කිරීමේදී අන්තර්ගත විය යුතු කොටස් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

(03) වන්නම් සඳහා අලංකාර මාත්‍රා නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කෙටියෙන් විස්තර කරන්න